# පරීක්ෂක වාර්තාව

AA1 විභාගය - ජූලි 2017

## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

(Economics for Business and Accounting)

---

මෙවර ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රයට උත්තර සැපයීමේදී අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ප්‍රාමාණික මට්ටමින් සාර්ථකව උත්තර සපයා ඇති බව දක්නට ලැබුණි. එසේ වුවද සමස්තයක් ලෙස ගත්කල සමහර ප්‍රශ්න සඳහා බොහෝ අයදුම්කරුවන් සපයා තිබූ උත්තර වල යම් යම් අඩුපාඩුකම් තිබූ බව පැහැදිලි විය. ඒ පිළිබඳව උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයන් පහත දැක්වේ:

## A - කොටස

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

සමස්තයක් ලෙස විෂය නිර්දේශයෙහි පුළුල් පරාසයක් ආවරණය වන පරිදි මුළු ලකුණු ප්‍රමාණයෙන් 40% ක් සඳහා මෙම කොටස සකස් වී තිබුණි. මූලික ආර්ථික විද්‍යාත්මක න්‍යායන් හා සංකල්ප පදනම් කර ගනිමින් විෂය නිර්දේශයෙහි බරතැබීම්වලට ගැලපෙන අයුරින් මෙය සැකසී තිබුණි. ප්‍රශ්න අංක 1.1 සිට 1.10 දක්වා දෙන ලද වරණයන් අතුරෙන් නිවැරදි වරණය තේරීමත්, ප්‍රශ්න අංක 1.11 සිට 1.15 දක්වා යම් ප්‍රකාශයක් දී එහි සත්‍ය හෝ අසත්‍ය බව දැක්වීමටත්, ප්‍රශ්න අංක 1.16 සිට 1.20 දක්වා දෙන ලද උත්තර දෙකක් ඇසුරින් නිවැරදි උත්තරය ලිවීමටත් යන සරල ආකෘතියක් යටතේ මෙම ප්‍රශ්නය සකස්කර තිබුණි.

මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් සාර්ථක ලෙස උත්තර සපයා සාධනීය මට්ටමකට ලකුණු ලබා තිබූ බව පෙනුණි. කෙසේවෙතත් මෙම කොටසේ සමහර ප්‍රශ්න සඳහා අයදුම්කරුවන්ගේ උත්තරවල අඩුපාඩු නිරීක්ෂණය විය.

දී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුනු වැරදි / දුර්වලතා කිහිපයක් පහත දැක්වේ:

1.1 "සූක්ෂම ආර්ථික විද්‍යාව" සංකල්පය පිළිබඳ දැනුම හා අවබෝධය මෙම ප්‍රශ්නය මඟින් අපේක්ෂා කරන ලදී. බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා නිවැරදි උත්තර සපයා තිබුණි.

1.2 මූලික ආර්ථික විද්‍යාත්මක සංකල්පයක් වන "නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය" සම්බන්ධ උපකල්පන පිළිබඳ අවබෝධය පරීක්ෂා කරන ලදී. සාර්ථක උත්තර බහුතරයක් දක්නට ලැබුණි.

1.3 පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය මැනීම පිළිබඳ අවබෝධය හා එකී සංකල්පය පිළිබඳ දැනුම මෙමඟින් විමසන ලදී. වැඩිදෙනෙක් සාර්ථකව උත්තර සපයා තිබූ නමුත් සමහර උත්තර වැරදි විය. ඉහත සංකල්ප දෙක අතර වෙනස පිළිබඳව ඇති අවබෝධය ප්‍රමාණවත් නොවීම සහ ජ්‍යාමිතික ගණනය පිළිබඳ අවබෝධය ප්‍රමාණවත් නොවීම අසාර්ථක උත්තරවලට හේතු විය.

1.4 උපයෝගිතා සංකල්පය පිළිබඳ දැනුම මැනීම සඳහා දෙන ලද සරල ප්‍රශ්නයක් වූ අතර, බහුතරයක් අයදුම්කරුවන් නිවැරදි උත්තර සපයා තිබුණි.

1.5 පිරිවැය සංකල්පය පිළිබඳ න්‍යායාත්මක දැනුම ප්‍රශ්නයෙන් විමසීමට ලක්කෙරුන අතර, නිවැරදි උත්තර මෙන්ම අනවබෝධය හේතුවෙන් බොහෝ වැරදි උත්තරද දක්නට ලැබුණි.

1.6 උපරිම මිල හා අවම මිල සම්බන්ධ සංකල්ප පිළිබඳ අවබෝධය මෙම ප්‍රශ්නයෙන් විමසුමට ලක්කර තිබුණි. එම සංකල්පයන් පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැතිකමින් වැරදි උත්තර තෝරා තිබුණි.

1.7 උද්ධමන අනුපාතිකය ගණනය කිරීම පිළිබඳ දැනුම මෙමඟින් පරීක්ෂා කර තිබුණි. බොහෝ උත්තර වැරදි ඒවා විය. ගණිතමය දුර්වලතාවය එයට ප්‍රධානතම හේතුව බව පෙනුණි.

1.8 ප්‍රායෝගික දැනුම පරීක්ෂා කෙරෙනු ලබන ප්‍රශ්නයකි. මහ බැංකු වාර්තා වැනි විෂය අනුබද්ධ පොත්පත් පරිශීලනය කර නොතිබූ බැවින් අසාර්ථක උත්තර බහුල වශයෙන් දක්නට ලැබුණි.

1.9 ගෙවුම් ශේෂ ලේඛනය පිළිබඳ මූලික අවබෝධය පරීක්ෂා කර තිබුණි. අසාර්ථක උත්තර වැඩි වශයෙන් දක්නට ලැබුණි. එමඟින් එම විෂය ක්ෂෙත්‍රය පිළිබඳව අයදුම්කරුවන් සතු අවම දැනුම මනාව ගම්‍ය විය.

1.10 ආර්ථික ක්‍රම පිළිබඳ අවබෝධය පරීක්ෂාවට ලක්කෙරෙන ප්‍රශ්නයකි. බොහෝ උත්තර නිවැරදි ඒවා විය. කෙසේනමුත්, ඇතැම් අයදුම්කරුවන් ආර්ථික ක්‍රම පටලවාගෙන ඇති බවක් දක්නට ලැබුණි.

1.11 - 1.15 දක්වා දෙනලද ප්‍රකාශයන්හි සත්‍ය / අසත්‍ය බව සටහන් කිරීම තුළින් නිවැරදි උත්තරය තෝරාගත යුතු විය. සමස්තයක් ලෙස ගත්කල මෙම ප්‍රශ්න වලට උත්තර සැපයීම සාර්ථක මට්ටමක පැවතුණි. එම ප්‍රශ්න 5 අතුරෙන් අයදුම්කරුවන්ගෙන් වැඩි ප්‍රමාණයක් වැරදි උත්තර දී තිබුණේ 1.12 ප්‍රශ්නයටයි. එමඟින් නම්‍යතා සංකල්පය මෙන්ම බදුබර බෙදියාම පිළිබඳ දැනුම හා අවබෝධය මැන බැලීම අපේක්ෂා කරන ලදි. අනවබෝධය හේතුවෙන් උත්තර පටලවාගෙන ඇතිබව දක්නට ලැබුණි.

1.16 - 1.20 දක්වා ප්‍රශ්නවලට දෙනලද උත්තර දෙක අතුරෙන් නිවැරදි උත්තරය තෝරාගත යුතු විය. ඉන් වැඩි ප්‍රමාණයක් වැරදි උත්තර දක්නට ලැබුණේ 1.16 ප්‍රශ්නයටයි. උපයෝගිතා සංකල්පය පිළිබඳ න්‍යායාත්මක දැනුම හා අවබෝධය එමඟින් අපේක්ෂා කරන ලදි. උපයෝගිතා සංකල්පය පිළිබඳව අයදුම්කරුවන්ගේ අවම දැනුම හේතුවෙන් උත්තර වරදවාගෙන තිබුණි.

## B කොටස

එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4 කි.

**ප්‍රශ්න අංක 02** - ලකුණු 10

(a) මෙම ප්‍රශ්නය මඟින් ආර්ථික විද්‍යාවේ මූලික සංකල්පයක් වූ සම්පත් පිළිබඳ දැනුම පරීක්ෂාවට ලක්කෙරෙන අතර, ආර්ථික නොවන සම්පත් හැඳින්වීම උදාහරණ සහිතව විමසා තිබුණි. බොහෝ අයදුම්කරුවන් නිවැරදිව උත්තර සපයා තිබුණි. "ආර්ථික නොවන සම්පත්" යන්නට නිවැරදි උත්තරය ඉදිරිපත් කිරීමෙන් සම්පූර්ණ ලකුණු 3 ම ලබාගත් අයදුම්කරුවන් බොහෝ විය. හිමිකමක් නොමැති, හිඟකමක් නොමැති, ආවස්ථික පිරිවැයක් නොමැති ලෙස නිවැරදිව සඳහන් කර උදාහරණයට වාතය, හිරු එළිය යන්න සඳහන් කර තිබුණි. එසේවුවත් බොහෝ අයදුම්කරුවන් උදාහරණයන් පමණක් නිවැරදිව දක්වා ඊට අදාල ලකුණු ප්‍රමාණය පමණක් ලබාගත් අවස්ථාද විය. ආර්ථික නොවන සම්පත්වල ලක්ෂණ සියල්ලම ලිවීමට අපොහොසත් වී ඇත. මෙම ප්‍රශ්නය පහසු වුවත් සමහර අයදුම්කරුවන් **ආර්ථික නොවන** යන්න හරිහැටි තේරුම් නොගත් බවක් දක්නට ලැබුණි.

(b) දෙනලද සංඛ්‍යා දත්ත භාවිත කරමින් මිල ඉල්ලුම් නම්‍යතාවය ගණනය කිරීම විමසීම තුළින් අයදුම්කරුවන්ගේ නම්‍යතා සංකල්පය පිළිබඳ අවබෝධය පරීක්ෂාවට ලක්කර තිබුණි. බොහෝ අයදුම්කරුවන් අවම ලකුණු ප්‍රමාණයක් ලබාගත් ප්‍රශ්නය මෙය විය. එනම් මිල ඉල්ලුම් නම්‍යතාවය ගණනය කිරීම පිළිබඳ අවබෝධය අවම මට්ටමක තිබෙන බව පෙනුණි. රු.10/- සිට රු.9/- ට මිල අඩුවූ විට නම්‍යතාවය ගණනය කල ආකාරය සාර්ථකය. සමහර අයදුම්කරුවන් සමීකරණයන් දැක්වීමට අපොහොසත් වී ඇත. නිවැරදි උත්තරය වන - 2.05 යන්න B ලක්ෂයේ මිල ඉල්ලුම් නම්‍යතාවය ගණනය කිරීම ඔවුන්ට අපැහැදිලි වුවක් ලෙස කිව යුතුය. සමීකරණය පමණක් ලියූ අයදුම්කරුවන්ද විය. සමීකරණය නිවැරදිව විසඳීමට ඔවුන් දැන සිටියේ නැත. අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙකු ස්ව-අධ්‍යයන පාඩම් පොත හරිහැටි පරිශීලනය කර නොමැති බව පෙනුණි.

(c) වෙළෙඳපොළ ව්‍යුහයන් පිළිබඳ දැනුම හා අවබෝධය මෙම ප්‍රශ්නය මගින් විමසීමට ලක් කෙරේ. බහුතරයක් අයදුම්කරුවන් නිවැරදි වෙළෙඳපොල ක්‍රම අතර සැසඳීම කර තිබුණි. මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් බහුතරය නිවැරදි උත්තරය ලෙස පූර්ණ තරගය හා ඒකාධිකාරය අතර වෙනස්කම් 4 ක් දක්වා ලකුණු 4 ක් ලබා ගත්හ. සමහරෙකුට පූර්ණ තරගකාරී වෙළෙඳපොළ පිළිබඳ නිවැරදි අවබෝධයක් නොතිබුණු බව දී තිබූ උත්තරවලින් පැහැදිලි විය. සමහර අයදුම්කරුවන් ඒකාධිකාරයට ඒකාධිකාරී තරගය පටලවාගෙන තිබුණි. මෙම වෙළෙඳපොලවල් පිළිබඳව අයදුම්කරුවන්කරුවන් විසින් නිසි අධ්‍යනයක් කර තිබුණේනම්, මෙය පහසුවෙන්ම ලකුණු ලබා ගැනීමට හැකිව තිබූ ප්‍රශ්නයකි.

එසේවුවද, සමහර උත්තරවල දක්නට ලැබුණු ප්‍රධාන අඩුපාඩුව වූයේ සංසන්දනාත්මකව දැක්වීම වෙනුවට එක් වෙළෙඳපොළක ලක්ෂණ පමණක් දක්වා තිබීමය. එසේම දීර්ඝ විස්තර ඉදිරිපත් කිරීමද බහුතරයක් අයදුම්කරුවන් විසින් සිදුකර තිබුණි.

## ප්‍රශ්න අංක **03**

(a) (i) දෙනලද ප්‍රකාශයට එකඟ වන්නේද නැද්ද යන සරල උත්තරය අපේක්ෂා කර තිබුණි. බොහෝ අයදුම්කරුවන් මෙයට "එකඟ වේ" යන නිවැරදි උත්තරය ලබා දී තිබුණි. මෙම ප්‍රශ්නයට එකඟ නොවූ අයදුම්කරුවන් සිටියේ ඉතා අල්ප ප්‍රමාණයකි.

(ii) බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට සාර්ථකව උත්තර ලියා නැති බව පෙනුණි. නිවැරදි උත්තරය වෙනුවට සමහරු ඉල්ලුම පිළිබඳ දීර්ඝ විස්තර ලියා තිබීමත් ඉල්ලුම කෙරෙහි බලපාන සාධක ලියා තිබීමෙනුත් ගම්‍ය වන්නේ අදාල සංකල්ප පිළිබඳ ඔවුන් තුළ නිවැරදි අවබෝධයක් නොතිබූ බවය.

(b) පරිමාණානුකූල ඵල වර්ග තුන පැහැදිලි කිරීම ඉතා නිවැරදිව සිදුකර තිබුණේ සුළු අයදුම්කරුවන් පිරිසකි. බොහෝදෙනා වර්ගීකරණය (ඵල වර්ග තුන) නිවැරදිව දක්වා තිබුණද ඒ පිළිබඳ අවබෝධයෙන් විස්තර කිරීම නිවැරදිව සිදුකර නොතිබුණි. මෙම ප්‍රශ්නයෙන් නිෂ්පාදන න්‍යාය පිළිබඳ අවබෝධය පරීක්ෂාවට ලක්කොට තිබුණි. එසේම කෙටි කාලය හා දිගු කාලය අතර වෙනස පිළිබඳ අවබෝධය ප්‍රමාණවත් නොවන බව උත්තර නිරීක්ෂණයේදී ගම්‍ය විය.

නිවැරදි උත්තරය වන ස්ථාවර, වැඩෙන සහ හීනවන පරිමාණානුකූල ඵල වෙනුවට සමහර අයදුම්කරුවන් මහා පරිමාණ, මධ්‍ය පරිමාණ, සුළු පරිමාණ යනුවෙන් හැඳින්වූ අතර, සමහර අයදුම්කරුවන් ආවස්ථික පිරිවැය අඩුවීම, වැඩිවීම ගැනද සඳහන් කර තිබුණි. මේ අනුව නිගමනය කළ හැක්කේ සමහර අයදුම්කරුවන් පරිමාණනුකූල ඵල නීතිය අඩංගු "දිගුකාලීන නිෂ්පාදිතය" සම්බන්ධව අධ්‍යනය / පරිශීලනය කර නොමැති බවය.

## ප්‍රශ්න අංක **04**

(a) (i) බොහෝ අයදුම්කරුවන් නිවැරදිව උත්තර සපයා තිබුණි. එහෙත් සමහර උත්තරවල දක්නට ලැබුණු දුර්වලතාව වූයේ,

- මුදල්වල ලක්ෂණ වෙනුවට මුදලේ කාර්යයන් ඉදිරිපත් කිරීම.
- මුදල් නෝට්ටුවක ඇති (මතුපිට) ලක්ෂණ දක්වා තිබීම.

උදා: මහ බැංකු අධිපතිගේ අත්සන යොදා ඇති බව.
නෝට්ටුවේ නූලක් (රිදී කෙන්දක්) ඇති බව.

යනාදී මතුපිට ඇති දෑ පිළිබඳව දීර්ඝ විස්තර ඉදිරිපත් කර තිබීමෙන් අදාල සංකල්පය පිළිබඳ දැනුම හා අවබෝධය ප්‍රමාණවත්ව නොතිබූ බව පෙනුණි. එසේම ඇතැම් අයදුම්කරුවන් මුදල් නෝට්ටුව විදුලි ආලෝකයට ඇල්ලූ විට එහි දිය සළකුණ, ඉරක් දිස්වීම, මහ බැංකු අධිපතිගේ සහ මුදල් ඇමතිගේ අනුමැතිය සහිත වීම වැනි වැරදි උත්තර දීර්ඝ වශයෙන් පැහැදිලි කර තිබුණි.

(ii) මුදලට ඇති ඉල්ලුම ඉතාම නිවැරදිව අර්ථ දක්වා තිබුණේ ඉතාමත් සුළු අයදුම්කරුවන් පිරිසකි. එසේම මුදල් සඳහා ඉල්ලුම, ගනුදෙනු / ආරක්ෂණ / සම්ප්‍රේක්ෂණ යන චේතනා තුනම මත සිදුවන බව දක්වා තිබුණේද ඉතා සුළු අයදුම්කරුවන් පිරිසකි. මුදලට ඇති ඉල්ලුම යනු මුදලේ ක්‍රය ශක්තිය යැයි වැරදියට වටහාගත් අයදුම්කරුවන්ද බහුතරයක් විය. මෙම සංකල්පය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම හා අවබෝධය ඉතා අල්ප මට්ටමක තිබූ බව හොඳින් පැහැදිලි විය.

(b) ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් තුනක් සඳහන් කිරීමේ ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ඉතා සාර්ථකව උත්තර සපයා තිබුණි. මුදල් නිකුත් කිරීම යන්න සෑම අයදුම්කරුවකු විසින්ම ලියූ උත්තරයකි. සමහර අයදුම්කරුවන් ලියා තිබූ උත්තර අතර,

- මහ ජනතාවට ණය ලබාදීම.
- බැංකු අයිරා පහසුකම් ලබාදීම.
- මහජනතාව වෙනුවෙන් ගිණුම් පවත්වාගෙන යැම සහ උපදෙස් ලබාදීම.

වැනි වැරදි උත්තර ලබා දී තිබුණි.

බැංකු ක්‍රම පිළිබඳව නිවැරදි අවබෝධයක් නොවූ බව උත්තර වලින් පැහැදිලි විය.

## ප්‍රශ්න අංක **05**

(a) මෙම ප්‍රශ්නය සඳහා බොහෝ අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා තිබූ බව පෙනුණි. සමහර අයදුම්කරුවන් ප්‍රස්තාර උපයෝගී කරගනිමින් නිවැරදිව උත්තර සපයා තිබුණි. කෙසේවෙතත් මෙම ප්‍රශ්නය සඳහා සපයන ලද වැරදි උත්තර අතර, තිබූ ප්‍රධානතම දුර්වලතාවය වූයේ අවම මිල සහ උපරිම මිල යන සංකල්ප දෙක නිවැරදිව අවබෝධ කර නොගෙන උත්තර සපයා තිබීමයි.

උදා: ප්‍රශ්නයේ සමතුලිත මිලට වඩා පහලින් උපරිම මිලක් පැනවීම යනුවෙන් සඳහන් කර තිබියදී පවා සමතුලිත මිලට වඩා මිල වැඩිවන බව පැවසීම, නිෂ්පාදකයාට වාසිවන බව පැවසීම, භාණ්ඩයේ මිල වැඩිවන බව පැවසීම යනාදී උත්තර වලින් පැහැදිලි වනුයේ මෙම සංකල්ප පිළිබඳ අනවබෝධය පමණක් නොව ප්‍රශ්නය නිවැරදිව තේරුම් ගැනීමට පවා අයදුම්කරුවන් අපොහොසත් වී ඇති බවය.

(b) බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා සම්පූර්ණ උත්තර සපයා නොතිබූ බව දක්නට ලැබුණි. ආරක්ෂණවාදය යන සංකල්පය පිළිබඳව නිවැරදිව අවබෝධ කරගෙන නොතිබූ බව එමගින් ගම්‍ය වේ. ඒ නිසා බොහෝ අදාල නොවන උත්තර සපයා තිබුණි.

උදා: - විදේශ විනිමය රට තුලට ගලා ඒම.
- අන්තර්ජාතික සහයෝගිතාව වර්ධනය වීම.
- අපනයන ප්‍රවර්ධනය වැනි අදාල නොවන උත්තර බහුතරයක් අයදුම්කරුවන් විසින් ලබාදී තිබුණි.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගැනීම ඉතාමත් දුර්වල මට්ටමක පැවතුණි.

## C කොටස

**ප්‍රශ්න අංක 06**

(A) (a) බොහෝ අයදුම්කරුවන් ප්‍රධාන ආර්ථික ක්‍රම වර්ග 3 නම්කර තිබුණි. ඒවා නම්,

(1) වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය,

(2) සැලසුම්ගත ආර්ථික ක්‍රමය සහ,

(3) මිශ්‍ර ආර්ථික ක්‍රමය, වේ.

එසේ වුවද අතලොස්සක් අයදුම්කරුවන් පහත සඳහන් වැරදි උත්තර ද ඉදිරිපත් කර තිබුණි:

(1) සාම්ප්‍රදායක ආර්ථික ක්‍රමය.

(2) සාර්ව ආර්ථික ක්‍රමය.

(3) විවෘත ආර්ථික ක්‍රමය.

(4) වැඩවසම් ආර්ථික ක්‍රමය.

(b) මෙම ප්‍රශ්නය සඳහා නිවැරදිව උත්තර සපයා තිබුණේ අයදුම්කරුවන්ගෙන් ඉතා සුළු සංඛ්‍යාවකි. ආර්ථික විද්‍යාව හදාරන සෑම සිසුවෙකුටම මෙම සංකල්ප පිළිබඳ අවබෝධයක් තිබීම අත්‍යාවශ්‍ය වේ. බොහෝ අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය මැනවින් අවබෝධ කරගෙන නොතිබීම නිසා අදාල කරුණු දැන සිටියද නිවැරදිව උත්තර ගලපා ගැනීමට නොහැකි වීමෙන් උපරිම ලකුණු ලබාගැනීමට අසමත් විය. මෙහිදිද දක්නට ලැබුණු ප්‍රධාන දුර්වලතා කිපයක් වූයේ,

(1) මූලික ආර්ථික ප්‍රශ්න නිවැරදිව ඉදිරිපත් නොකිරීම,

(2) එම ආර්ථික ප්‍රශ්න ඉහත එක් ආර්ථික ක්‍රමයක් මගින් විසඳා ගන්නා ආකාරය දක්වනවා වෙනුවට සියලු ආර්ථික ක්‍රම මගින් ඒවා විසඳන ආකාරය විස්තර කර තිබීම තුලින් අනවශ්‍ය විස්තර ලිවීම හා කාලය අපතේ යවා තිබුණි,

(3) එක් එක් ආර්ථික ප්‍රශ්න විසඳා ගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කිරීම වෙනුවට පොදුවේ ආර්ථික ක්‍රම මගින් ඒවා විසඳා ගන්නා ආකාරය දක්වා තිබීම,

(4) එසේම ආර්ථික ප්‍රශ්න විසඳා ගන්නා ආකාරය වැරදි ලෙස අර්ථකතනය කර තිබීම,

(5) මූලික ආර්ථික ප්‍රශ්න 3 පමණක් හඳුන්වා තිබීම,

යනාදියයි.

(B) "ජාතික ගිණුම්කරණය" ප්‍රායෝගික භාවිතය හා අවබෝධය පරීක්ෂාවට ලක්කෙරෙන මෙම ප්‍රශ්නයට සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට හැකිවූ අයදුම්කරුවන් සිටියේ ඉතාමත් අඩු සංඛ්‍යාවකි.

(a) මෙම කොටස සඳහා බොහෝ අයදුම්කරුවන් නිවැරදිව උත්තර සපයා තිබුණි. එසේ වුවත් සමහර අයදුම්කරුවන්ට එම කොටස සඳහා උපරිම ලකුණු අහිමි වූයේ ගණිතමය දෝෂ (එකතුකිරීමේ දෝෂ) නිසාය.

(b) මෙම කොටස සඳහාද අසාර්ථක උත්තර සැපයීමට ප්‍රධාන හේතුව වූයේ ශුද්ධ වක්‍ර බදු නිවැරදිව ගණනය කිරීමට නොදැන සිටීමය. එසේම මෙහිදී,

(1) සහනාධාර හා වක්‍ර බදු යන දෙකම එකතු කර තිබීම,

(2) වක්‍ර බදු - සහනාධාර, වෙනුවට සහනාධාර - වක්‍ර බදු ලෙස ගණනය කර තිබීම

(3) වක්‍ර බදු හෝ සහනාධාර යන දෙකින් එකක් පමණක් සාධක පිරිවැය මිලට එකතු කිරීම යනාදි වැරදි සිදුකර තිබුණි.

(c) බොහෝ අයදුම්කරුවන් මූර්ත දළ දේශීය නිෂ්පාදිතය නිවැරදිව ගණනය කර නොතිබූ බව දක්නට ලැබුණි. ඇතැම් අයදුම්කරුවන් මූර්ත දළ දේශීය නිෂ්පාදිතය ගණනය සඳහා භාවිත කරන සමීකරණය වැරදි ලෙස ලියා තිබීම සහ එම සමීකරණය නොදැන සිටිබව දක්නට ලැබුණි. එසේම ගණනය කිරීමේ දෝෂ ද බහුලව දක්නට ලැබුණි. කෙසේවෙතත්, නිවැරදිව උත්තර සපයා තිබුණේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසකි.

- - -

<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>

1. විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති පිළිතුර පිළිබඳව නිශ්චිත ඍජු පිළිතුරු සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

3. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථන වලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

4. මෙම විෂයට අදාල ස්ව-අධ්‍යයන පාඩම්මාලාව, ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, මහ බැංකු වාර්තා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.

5. පිළිතුරු ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

6. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

7. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

8. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

9. ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සන්සන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

10. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

11. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

12. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -